# හින්දී සාහිත්‍ය ඉතිහාසයේ පළමු යුගය 'ආදිකාල්' ලෙස නම් කිරීමෙහි උචිතානුචිත බව

*නෙත්මිණී, ආර්. එම්. තමාෂා* [1]

හින්දී සාහිත්‍ය ඉතිහාසය සම්බන්ධව **ආචාර්ය නගේන්ද්‍ර** විසින් ඉදිරිපත් කරන ලද වර්ගීකරණය සම්මත වර්ගීකරණය ලෙස වර්තමානයේ පිළිගෙන ඇත. හින්දී සාහිත්‍ය ඉතිහාසය විද්වතුන් විසින් යුග 4කට බෙදා දක්වනු ලැබ ඇත. එනම් '**ආදි කාල්**', '**භක්ති කාල්**', '**රීති කාල්**', '**ආධුනික් කාල්**' ලෙසයි. එම යුග අතරින් 7වන සියවසේ මැද භාගයේ සිට 14වන සියවසේ මැද භාගය එනම් ක්‍රි. ව. 1000-1300 දක්වා කාලය 'ආදිකාලය'යි. වර්තමානය වන විට මෙම යුගය ආදිකාල් ලෙස හැඳින්වුවද අතීතයේ සිටම මෙම යුගය හැඳින්වීමෙහි ලා නොයෙක් විද්වතුන් විසින් නොයෙක් මත ඉදිරිපත් කරනු ලැබ ඇත. එමගින් තම මතයේ නිරවද්‍යතාව තහවුරු කරන්නට උත්සාහ දරා ඇත. මෙලෙස එම යුගයේ නාමකරණය සඳහා ප්‍රධාන වශයෙන් එකල පැවති සාමාජික, ආගමික, දේශපාලනික තත්ත්වයන් මෙන්ම එකල බිහි වූ නිර්මාණ රචනා හා ඒ සඳහා යොදාගත් භාෂාව පාදක වී ඇත. මෙලෙස '**ප්‍රාචීන් කාල්**', '**වීර්ගාථා කාල්**', '**ආදි කාල්**', '**චාරණ් කාල්**', '**ප්‍රාරම්භික් කාල්**', '**සන්ධිකාල්**', '**සිද්ධ් සාමන්ත් කාල්**', '**රාසෝ කාල්**', '**අපභ්‍රංශ් කාල්**' ආදි වශයෙන් විවිධ නාමයන් ඉදිරිපත් වූයේ එකම යුගයක් අරබයාය. විවිධ විද්වතුන් විසින් ස්වමතානුරූපීව නාමයන් කොපමණ ප්‍රමාණයක් ඉදිරිපත් කළද එම අදාළ යුගය සඳහා බොහෝ විට භාවිත විය හැක්කේ එක් නාමයක් පමණි. මෙම සියලු නාමයන් අතරින් වඩාත් සුදුසුම නාමය කුමක් විය හැකිද? අනෙකුත් නාමයන් ඉදිරිපත් කිරීමෙහි ලා කොපමණ විශ්වසනීයත්වයක් හිමි වේද? යන කරුණු සැලකිය හැක. හින්දී සාහිත්‍ය ඉතිහාසයේ පළමු යුගය 'ආදි කාල්' ලෙස නම් කිරීමෙහි ලා උචිත-අනුචිත බව දැක්වීම මෙහි අරමුණ වෙයි. මෙම පර්යේෂණයේ නිගමනය ලෙස දැක්විය හැක්කේ හින්දී සාහිත්‍ය ඉතිහාසයේ පළමු යුගය '**ආදි කාල්**' ලෙස නම් කළ යුතු බවයි.

**ප්‍රමුඛ පද:** ආදි කාල්, ආධුනික් කාල්, භක්ති කාල්, රීති කාල්, හින්දී සාහිත්‍ය ඉතිහාසය

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) ප්‍රථම වසර, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*thamasha.neth@gmail.com*